# <u>2024 ජාතික පාසල් ගුරුවරුන්ගේ ස්ථාන මාරු අයදුම්පත පිරවීම සඳහා උපදෙස්</u>

<u>අයදුම්පත පිරවීමේ දී පහත පියවරයන් අනුගමනය කරන්න.</u>

## <u>අයදුම්පත පිරවීමේදී අනුගමනය කළ යුතු පොදු කොන්දේසි</u>

- **අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර www.nemis.moe.gov.lk දිගුව මඟින් ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියට(NEMIS) තම ජාතික හැඳුනුම්පත් අංකය මඟින් පිවිස, එහි දැක්වෙන තොරතුරු නිවැරදි බවට තහවුරු කර ගත යුතු ය.**
- **තම තොරතුරු ඇතුළත් ව නැත්නම් හෝ යම් සංශෝධනයක් සිදු විය යුතු නම්, තමා සේවය කරන පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලයේ NEMIS සම්බන්ධීකරණ නිලධාරියා හමුවී අදාළ ලේඛන ඉදිරිපත් කර තොරතුරු යාවත්කාලීන කර ගත යුතු ය.**
- **2023.12.31 දිනට වර්තමාන පාසලේ සේවා කාලය වසර 10ක් හෝ ඊට වැඩි නම් හා වයස අවුරුදු 55 ට අඩු නම් අනිවාර්යයෙන් ස්ථාන මාරු අයදුම් කළ යුතු ය.**
- **අයදුම්පත ගුරුවරයා විසින් ම මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කර මුද්‍රිත පිටපත 2024.05.17 දින හෝ එදිනට පෙර හෝ තමා විසින් ම විදුහල්පති වෙත භාර දිය යුතු ය. (by hand)**
- **අයදුම්පත යොමු කළ පසු (submit) නැවත සංශෝධන සිදු කළ නොහැකි බැවින් නිවැරදිභාවය තහවුරු කර ගැනීමෙන් පසු අයදුම්පත යොමු කිරීමට (submit) සෑම ගුරුවරයකු ම වග බලා ගත යුතු ය.**

1. අයදුම්පත පිරවීමට පෙර www.nstt.moe.gov.lk දිගුව ඔස්සේ පිවිස [Login as a teacher] තෝරන්න.
2. තිරයේ දිස්වන උපදෙස් කියවා අවබෝධ කර ගන්න. අනතුරුව තිරයේ පහළින් දිස්වන I have read and understood the guideline☐ve හි (check box) මත (√) සලකුණු කර, දී ඇති උපදෙස් අවබෝධ කර ගත් බව සහතික කරන්න.
3. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදි ව ඇතුළත් කර proceed click කර, අදාළ අයදුම්පත්‍රය වෙත යොමු වන්න. ඔබගේ වර්තමාන ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර ඉදිරියට යා නොහැකි නම්, ඔබගේ පැරණි ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර, නැවත උත්සාහ කරන්න.
4. ස්ථාන මාරු අයදුම්පත විවෘත නොවේ නම්, ඔබගේ තොරතුරු ජාතික පාසල් ගුරුවරයකු ලෙස NEMIS පද්ධතිය වෙත ඇතුළත්ව නොමැත. එසේ නම් ඔබ සේවය කරන පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලයේ NEMIS සම්බන්ධීකරණ නිලධාරියා හමුවී අදාළ ලේඛන ඉදිරිපත් කර තොරතුරු යාවත්කාලීන කර ගත යුතු ය.
5. ඒ අනුව මාර්ගගත ගුරු ස්ථාන මාරු අයදුම්පත්‍රය පිරවීමේ දී පහත උපදෙස් අනුගමනය කරන්න.

5.1. **අයදුම්පතෙහි අංක 1 සිට 16 දක්වා -** Basic Information

5.1.1 ඔබගේ මූලික තොරතුරු නිවැරදි ද යන්න පරීක්ෂා කරන්න. කිසියම් සංශෝධනයක් කිරීමට අවශ්‍ය

නම් හෝ යම් තොරතුරක් ඇතුළත් ව නැත්නම් , Are you sure that above information is correct සඳහා NO තෝරන්න. ඔබ සේවය කරන පාසල අයත් කලාප කාර්යාලයේ NEMIS සම්බන්ධීකරණ නිලධාරියා හමුවී අදාළ ලේඛන ඉදිරිපත් කර තොරතුරු යාවත්කාලීන කරවා ගත යුතු ය.

5.1.2 අනු අංක 4, 6, 8, 11, 12, 13, 15 හා 16 හි පෙන්වන තොරතුරුවල කිසියම් හෝ දෝෂයක් පවතී නම් සංශෝධනයට අවස්ථාව දී ඇත.

5.1.3 Basic Information හි තොරතුරු නැවත පරීක්ෂා කර සියල්ල සම්පූර්ණ හා නිවැරදි නම් පමණක් Are you sure that above information is correct සඳහා YES තෝරන්න. **Next page** මඟින් ඉදිරියට යන්න.

5.2 **අයදුම්පතෙහි අංක 17 සිට 23 දක්වා - Additional Information**

5.2.1 අංක 17 යටතේ, ඔබගේ මුලකුරු සමඟ නම සිංහලෙන් හෝ දෙමළෙන් ඇතුළත් කරන්න.

5.2.2 අංක 18 යටතේ, ඔබගේ පත්වීමේ ස්වභාවය තෝරන්න.

5.2.3 අංක 19 යටතේ, මෙම ස්ථාන මාරුවේදී සැලකිය යුත්තේ කුමන ලිපිනය ද යන්න නිවැරදි ව තෝරන්න.

5.2.4 අංක 20 යටතේ, පසුගිය වසර 05 තුළ ( 2020 -2024 ) ඉගැන්වීම් කාලසටහනට අදාළ ව සම්පූර්ණ කරන්න. එක් විෂයයකට වැඩි විෂය ප්‍රමාණයක් යම් වසරක උගන්වා ඇත්නම් වැඩි කාලච්ඡේද ප්‍රමාණයක් ඉගැන්වූ විෂයය සඳහන් කරන්න. Section සඳහා primary තෝරන්නේ නම්, එක් එක් වර්ෂයට අදාළව ඉගැන් වූ ශ්‍රේණිය තෝරන්න.

විෂයය special education වන විට section හා medium පමණක් තේරීම ප්‍රමාණවත් ය.

5.2.5 ඔබ යම් විෂයයකට විද්‍යාපීඨ හෝ වෙනත් වෘත්තීය පුහුණුවක් ලබා ඇත්නම් පමණක් අනු අංක 21 යටතේ වූ කොටස සම්පූර්ණ කරන්න.

5.2.6 ඔබ උපාධියක් සම්පූර්ණ කර ඇත්නම් පමණක් අනු අංක 22 යටතේ වූ කොටස ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතු ය.

5.2.7 ඔබ වර්තමානයේ තාවකාලික අනුයුක්තයක් ලබා වෙනත් පාසලක හෝ ආයතනයක සේවය කරන්නේ නම්, අනු අංක 23 හි ඉදිරියේ ඇති කොටුව මත "yes. attached" යන්න තෝරන්න. ඒ යටතේ අනු කොටස් නිවැරදිව සම්පූර්ණ කරන්න.

5.2.8 Additional Information හි තොරතුරු නිවැරදි ද යන්න නැවත පරීක්ෂා කර, සියල්ල සම්පූර්ණ හා නිවැරදි නම් පමණක් **Next page** මඟින් ඉදිරියට යන්න.

5.3 **අයදුම්පතෙහි අංක 24 සිට 26 දක්වා - Transfer Request**

5.3.1 අනු අංක 24 යටතේ ඔබ ස්ථාන මාරු අපේක්ෂා කරන ස්ථාන මාරු වර්ගය තෝරා ගන්න.

5.3.1.1 ජාතික පාසලකින් ජාතික පාසලකට ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම්,

අදාළ පාසල් වර්ගය තේරූ පසු ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන පාසල් 05ක් නම් කිරීමට අවස්ථාව හිමි වේ. අවම ජාතික පාසල් 02ක් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. (පාසලේ නම Search කිරීමෙන් පාසල තෝරා ගත හැකිය.) ස්ථාන මාරු ලබා දීමේදී ඉල්ලා ඇති පාසල් අනුපිළිවෙල සලකා බලනු ලැබේ. ඔබ තේරූ පාසල හා ලිපිනය නිවැරදි ද යන්න නැවත පරීක්ෂා කරන්න.

ඔබ තේරූ පාසල වෙත ස්ථාන මාරුව සඳහා සැලකිය යුතු ලිපිනයේ සිට දුර ආසන්න කිලෝ මීටරයට ඇතුළත් කිරීම අනිවාර්ය වේ.

5.3.1.2 ජාතික පාසලකින් පළාත් පාසලකට ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම්,

අදාළ පාසල් වර්ගය තේරූ පසු ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන පළාත හා එම පළාතේ අදාළ පළාත් පාසල් ඇතුළත් කරන්න. පළාත හා ඉල්ලුම් කරන පාසල නම් කිරීමට අවස්ථා 05ක් හිමි වේ. (පාසලේ නම Search කිරීමෙන් පාසල තෝරා ගත හැකි ය.) අවම පළාත් පාසල් 02ක් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. පළාත් රාජ්‍ය සේවයට නිදහස් කිරීමට නිර්දේශ වුවහොත්, අවශ්‍ය ලේඛන භාර දුන් පසු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ. එහිදී ලබා දෙන පාසල පිළිබඳව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් තීරණය කරනු ඇත.

5.3.1.3 ජාතික පාසලකින් ජාතික පාසලකට හෝ පළාත් පාසලකට යන අවස්ථා දෙකම අපේක්ෂා කරන්නේ නම්,

අදාළ පාසල් වර්ගය තේරූ පසු ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන ජාතික පාසල් 05ක් හා පළාත් පාසල් 05ක් නම් කිරීමට අවස්ථාව හිමි වේ. (පාසලේ නම Search කිරීමෙන් පාසල තෝරා ගත හැකි ය.) අවම වශයෙන් ජාතික පාසල් හා පළාත් පාසල් 02 බැගින් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. ස්ථාන මාරු ලබා දීමේ දී ජාතික පාසල් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන අතර ඉල්ලා ඇති පාසල් අනුපිළිවෙලට සලකා බලනු ලැබේ. පළාත් රාජ්‍ය සේවයට නිදහස් කිරීමට නිර්දේශ වුවහොත්, අවශ්‍ය ලේඛන භාර දුන් පසු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ. එහිදී ලබා දෙන පාසල පිළිබඳව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් තීරණය කරනු ලැබේ.

5.4 ඔබ එකම පාසලේ වසර 10ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කිරීම හේතුවෙන් අනිවාර්ය ස්ථාන මාරු සඳහා යටත් වූ ගුරුවරයෙකු නම්, අනු අංක 25 යටතේ ස්ථාන මාරු ඉල්ලීම සඳහා හේතුව ස්වයංක්‍රීයව සම්පූර්ණ වේ.

5.5 ඔබ වාර්ෂික ස්ථාන මාරු යටතේ වෙනත් හේතුවක් මත ස්ථාන මාරු අයදුම් කරන ගුරුවරයකු නම් අනු අංක 25 යටතේ ඔබ ස්ථාන මාරු අයදුම් කිරීමට හේතුව නිවැරදිව තෝරා ගන්න. හේතුව ලෙස Medical reason තෝරන්නේ නම් මුද්‍රිත පිටපත සමඟ පාසල වෙත යොමු කර ඇති TTB/2024/05 ආකෘතිය සම්පූර්ණ කළ යුතු ය.

5.6 අනු අංක 26 යටතේ, අයදුම්පතෙහි ඔබ ලබා දුන් තොරතුරුවලට වඩා වැඩි යමක් ඇතුළත් කිරීමට ඇත්නම් එය ඉතා කෙටියෙන් සඳහන් කරන්න.

5.7 ඔබ ඇතුළත් කළ තොරතුරු සම්පූර්ණ කර නැවත පරීක්ෂා කිරීමෙන් පසුව නිවැරදි නම් Next page මගින් ඉදිරියට යන්න. ඔබ ලබා දුන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සඳහන් කර I hereby declere that the information and particulars given above are true and accurate and there are no disciplinary or/and investigation proceedings or/and audit quiries. I further acknowledge that mentioning false or misleading information is an offense subject to a disciplinar[ ]alty. හි මත Click කළ පසු අයදුම්පත යොමු ක Submit Application යන්න click කළ යුතු ය.

6. අනතුරුව Your Teacher Transfer Application is pending for principal's recommendation යන්න දිස්වූ පසු පහළින් පෙන්නුම් කරන Download Application යන්න Click කර, ඔබගේ අයදුම්පත බාගත කර ගත යුතු ය.

7. එම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් ලබා ගෙන එහි දිනය සහ අත්සන යොදා අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනය වන 2024.05.17 දින හෝ එදිනට පෙර තමා විසින්ම පාසලේ විදුහල්පති වෙත භාර දිය යුතුය. අයදුම්පතේ මුද්‍රිත පිටපත සමඟ අමුණා එවිය යුතු ලිපි ලේඛන පහත පරිදි වේ.

i. පත්වීම් ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත,
ii. අවසන් වරට ඔබ වෙත නිකුත් කර ඇති ස්ථාන මාරු ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත
iii. 2024 වර්ෂයේ කාලසටහනේ විදුහල්පති සහතික කළ පිටපත
iv. පත්වීම් විෂයය නොවන විෂයක් උගන්වන්නේ නම්, ඒ සඳහා වන ඉහළම සුදුසුකමට අදාළ සහතිකයේ සහතික කළ පිටපත
v. වෛද්‍ය කරුණු ඉදිරිපත් කිරීමට ඇත්නම් රජයේ රෝහලක හෝ ලියාපදිංචි පෞද්ගලික රෝහලක රෝගියාට ප්‍රතිකාර කරනු ලබන විශේෂඥ වෛද්‍යවරයා විසින් නිර්දේශ කරන ලද TTB/2024/05 ආකෘතිය

8. පොදු කරුණු -

- ඕනෑම අවස්ථාවක ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය මගින් www.nstt.moe.gov.lk දිගුව ඔස්සේ පිවිස ස්ථාන මාරු අයදුම්පත පිළිබඳ වර්තමාන තත්ත්වය පරීක්ෂා කළ හැක.
- අයදුම්පත පුරවා Submit කළ හැක්කේ එක් වරක් පමණි.
- අයදුම්පත පිරවීමේ දී ඉහත කරුණුවලට අමතරව යම් තාක්ෂණික ගැටලුවක් පවතී නම් 011- 2075854 හෝ 011-2784434 දුරකථන අංකවලට රාජකාරී කාලය තුළ දැනුම් දිය හැක.

ජේ. එච්. වීරරත්න
අධ්‍යාපන අධ්‍යක්ෂ
ජාතික පාසල් ගුරු ස්ථාන මාරු
අධ්‍යාපන ලේකම් වෙනුවට